**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2022**

-----------------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි සම්බන්ධව පරීක්ෂා කිරිමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- තත්ත්වාගණනය කළ මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;
- යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානයකට අනුකූලව අරමුදල ක්‍රියාකර ඇති බව,

සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අරමුදල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ජලය, විදුලිය හා කාර්යාල පහසුකම් ලබා ගෙන තිබූ අතර ඒ සඳහා අදාළ වන ජල ගාස්තු, විදුලි ගාස්තු හා කාර්යාල කුලී ගණනය කොට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වන වියදම් නිසි පරිදි ගිණුම්ගත වී නොතිබුණි. කෙසේ නමුත්, 2022 අයවැය ඇස්තමේන්තු තුළ ජලය හා විදුලිය වෙනුවෙන් රු.මිලියන 1ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | මෙම ගෙවීම් කිරීම සඳහා නියමිත ක්‍රමවේදයක් හඳුනාගෙන නොමැති බැවින් ඉදිරියේදී දෙපාර්තමේන්තු නිලධාරීන් සමඟ සාකච්ඡා කර නිවැරදි ක්‍රමවේදයක් අනුව කටයුතු කරනු බව. | වර්ෂයට අදාළ සියලු වියදම් නිසි පරිදි හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ii) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් තිදෙනෙකු අරමුදලේ පූර්ණකාලීන සේවයට යොදවා ඇති අතර, එම නිලධාරීන් තිදෙනාට අදාළව සමාලෝචිත වර්ෂය තුළ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ගෙවා ඇති වැටුප් හා වේතන රු.මිලියන 2.122ක වියදම වායු විමෝචන අරමුදලේ වියදමක් ලෙස ගිණුම්ගත කොට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට නැවත ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අරමුදලේ හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන නිලධාරීන් වායු විමෝචන භාරකාර අරමුදලට අනුයුක්ත කරනු ලබයි. ඔවුන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරීන් බැවින් දෙපාර්තමේන්තු මඟින්ම වැටුප් ගෙවා ඇත . | වර්ෂයට අදාළ සියලු වියදම් නිසි පරිදි හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (iii) | අරමුදල සතුව පැවති PC-4948 දරන කැබ් රථය 2020 දෙසැම්බර් 13 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත නිත්‍යානුකූලව පවරා දී ඇතත්, ඊට අදාළව රු.මිලියන 5.080 රථයේ පිරිවැය හා සමුච්චිත ක්ෂයවීම ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | PC-4948 දරණ රථයට අදාළ පිරිවැය හා සමුච්ත ක්ෂය ප්‍රමාණය ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබිය යුතුය. |
| (iv) | භාවිතයට ගන්නා නමුත් ශුද්ධ අගය ශුන්‍ය වී ඇති පිරිවැය රු. මිලියන 21.290ක් වූ වාහන 03ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | පිරිවැය රු. මිලියන 21.290 ක් වූ වාහන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබිය යුතුය. |
| (v) | අරමුදල වෙත ලැබෙන ආදායම් මාසිකව ඉතිරි කිරීමේ ගිණුමකට මාරු කෙරෙන අතර, එම ඉතුරුම් ගිණුමෙහි එක්රැස්වන මුදල් කාලීනව සුදුසු කෙටිකාලීන ආයෝජනයන්හි නොයොදවා | ඉදිරියේදී අතිරික්ත මුදල් නිසි පරිදි ආයෝජනය කිරීමට කටයුතු කරන බව. | අතිරික්ත අරමුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 300ක් දක්වා ඉතිරි කිරීමේ ගිණුමේ රඳවා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් විගණනය කළ ගණනය කිරීම් අනුව ආසන්න වශයෙන් රු.මිලියන 18 පොළී ආදායමක් අහිමි වී තිබුණි. තවද ඉතිරි කිරීමේ ගිණුම තුළ වර්ෂ අවසානයේ රු.මිලියන 121ක ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. | | |
| (vi) | අරමුදල විසින් 2018 දෙසැම්බර් 17 මිලදී ගෙන ඇති නමුත් 2020 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන වෙත පවරා දී ඇති එකතු පිරිවැය රු.මිලියන 129.999ක් වන වායු තත්ත්ව මැනීමේ උපකරණ තුනක් සඳහා රු. මිලියන 25.999ක ක්ෂය වීම් ගණනය කර මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නීත්‍යානුකූල පැවරීම් සිදු කළ දිනයේ සිට අදාළ වන ක්ෂය ප්‍රමාණය ගිණුම් පොත්වලින් ඉවත්කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබිය යුතුය. |
| (vii) | සැපයුම්කරුවකු වෙතින් වායු තත්ත්වය මැනීමේ උපකරණ මිලදී ගැනීමේදී (Ambient Air Quality meters) ඇතිකර ගත් එකඟතාවය අනුව අදාළ උපකරණ භාවිතය සම්බන්ධයෙන් ලබා දීමට අපේක්ෂිතව තිබූ විදේශ පුහුණුවක් ලබාදීමට එකී සැපයුම්කරු ක්‍රියා නොකිරීම හේතුවෙන් ගෙවීම් නොකර රඳවා ගෙන ඇති රු.මිලියන 2ක ගෙවීමක් එකී ආයතනයෙහි එකඟතාවය ලබාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කිරීමකින් තොරව තවදුරටත් ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | අදාළ සැපයුම්කාර ආයතනයෙන් විමසා රු.මිලියන 2 මුදල ගිණුම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | මෙම ගෙවිය යුතු ශේෂය පොත්වලින් ඉවත්කර ආදායමට ගැලපිය යුතුය. |

### 1.5.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1615/702/002-xvii හා 2017 අගෝස්තු මස 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය ප්‍රකාරව නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2018හි 03 හා 04 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී වායු විමෝචන අරමුදල ඈවර කර වගකීම් පියවා වසා දැමීමට කටයුතු කළ යුතු වුවත් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්, මුදල් අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යවරයා මඟින් අරමුදලේ අයවැය ලේඛණ අනුමත කර ගනිමින් අරමුදල පවත්වාගෙන යාමට අරමුදලේ භාරකාර මණ්ඩලය කටයුතු කර තිබුණි. | අරමුදල අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තීරණයක් ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර ඇත. | අරමුදලේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරිම සඳහා කඩිනමින් අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වායු විමෝචන පරීක්ෂා සිදුකරන පෞද්ගලික සමාගම් දෙකක් සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව එක් එක් වාහනය සඳහා අය කරන පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 10ක් වායු විමෝචන අරමුදල වෙත ගෙවිය යුතු වේ. එහෙත් උක්ත පෞද්ගලික සමාගම් සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව, ඔවුන් අය කරගෙන ඇති පරීක්ෂණ ගාස්තුව හා ඒ අනුව වායු විමෝචන අරමුදල වෙත ලැබිය යුතු ආදායම පිළිබඳව පරීක්ෂාකර රජයට ලැබිය යුතු ආදායම් නිසිලෙස ලැබුණේ ද යන්න තහවුරුවකින් තොරව ප්‍රවර්තන වර්ෂය තුළ අදාළ සමාගම් දෙක අරමුදල වෙත ප්‍රේෂණය කර ඇති රු.මිලියන 272.23ක් අගය අරමුදලේ ආදායම ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර තිබුණි. | දුම් පරීක්ෂණ ප්‍රතිඵල යොමු වන්නේ ICTA ආයතනයට වන අතර එමගින් වායු විමෝචන අරමුදලට අදාල තොරතුරු ලබා ගැනීම සිදුකෙරේ. එබැවින් එම ක්‍රියාවලිය තුලින් ලැබෙන තොරතුරු මත පදනම්ව වායු විමෝචන අරමුදලට ලැබෙන 10% ක මුදල ගණනය කරනු ලැබේ . | වායු විමෝචන පරීක්ෂා සිදුකරන පෞද්ගලික සමාගම් දෙකෙහි පරීක්ෂණ ගාස්තු ආදායම පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| මු.රෙ. 876 (2) (අ) | දැනට පවතින අරමුදල් ක්‍රියාත්මක වීම ජාතික අවශ්‍යතාවක් බව පෙනී යන්නේ නම් හා එම අරමුදල් සඳහා නිසි පරිදි පනතක් මඟින් පාර්ලිමේන්තුවේ අනුමත වී නොමැති නම් එම අරමුදල් සඳහාමෙම චක්‍රලේඛය නිකුත් කර වසරක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතියක් ලබා නොතිබුණි. | අරමුදල අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තීරණයක් ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර ඇත. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.252,377,705 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.248,572,349 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. රු.3,805,356 ක වර්ධනයක් නිරීක්ෂණය වන අතර පෙර වර්ෂයට සාපේක්ෂව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.34,393,151 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) වායු විමෝචන භාරකාර මණ්ඩලය ඇවර කර මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලයක් පිහිටුවීමට 2017 දෙසැම්බර් 10 දිනැති අංක DMS/1143/VETF කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී තිබියදී සහ අංක PFD/RED/CIR/2018/02 දරන 2018 අගෝස්තු 18 දිනැති භාණ්ඩාගාර ලේඛම්වරයාගේ ලිපිය මඟින් වායු විමෝචන අරමුදල ඇවර කිරීම සඳහා නිර්දේශ ලබා දී තිබිය දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස ස්ථාපිත කිරීමකින් තොරව අනුමත කාර්ය මණ්ඩලය නොසලකා හැර ඊට පරිභාහිර තනතුරු 18ක් පවත්වා ගනිමින් රු.7,360,976ක වැටුප් හා දීමනා ගෙවීමට වැටුප් හා දීමනා ගෙවමින් අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමට අරමුදලේ පාලක මණ්ඩලය කටයුතු කර තිබුණි. | වාහන වායු විමෝචන පරික්ෂණ ව්‍යාපෘති කාර්යාලයේ කාර්යයන් අනිකුත් සාමාන්‍ය රාජ්‍ය සේවයේ කාර්යයන්ට වැඩි විශේෂිත වූ සුදුසුකම් සහිත කාර්යමණ්ඩලයක් මඟින් ඉටුකර ගත යුතුව ඇත. ඒ සඳහා කාර්යමණ්ඩලය දෙස් විදෙස් පුහුණුව සඳහාද ලක් කර ඇත. ඒ අනුව කාර්ය මණ්ඩලය සඳහා තනතුරු නාම සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කලද 2017.12.10 දිනැති හා අංක MT/02/01/01/02/11/II දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ සඳහන් පරිදි ව්‍යාපෘති කාර්යාලය සඳහා තනතුරු රජයේ අනුමත සේවා වලින් ලබා ගැනීම යොජනා වී ඇති බැවින් මේ වන විට භාරකාර අරමුදලේ සේවයේ නියුතු නිලධාරින් එම සේවා වලට අන්තග්‍රහණය කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් මතු වී ඇත. මේ සම්බන්දව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, රාජ්‍ය අමාත්‍යාංශය සමග සාකච්චා පවත්වා ඇති අතර ඒ අනුව ප්‍රවාහන අමාත්‍යතුමා වෙත කැබිනට් පත්‍රිකාවක් යොමු කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) වායුතත්ත්ව මැනීමේ උපකරණ සම්බන්ධයෙන් 2020 ජනවාරි 16 හා 2020 නොවැම්බර් 03 දින අරමුදලේ භාරකාර මණ්ඩලය ගෙන ඇති තීරණය ප්‍රකාරව එකතු පිරිවැය රු.මිලියන 82.752ක් වන Eco Tech මාදිලියේ ස්ථාපිත සංසරණ වායු තත්ත්ව මැනීමේ ඒකක 02 ක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත හා පිරිවැය රු.මිලියන 47.247ක් වන ජංගම සංසරණ වායු තත්ත්ව මැනීමේ උපකරණ කට්ටලයක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත පවරාදීමට කටයුතු කර ඇති නමුත් අදාළ ආයතනය වෙත පවරා ඇති උපකරණවල මෙහෙයුම් අලුත්වැඩියා හා නඩත්තුසේවා සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත රු.මිලියන 17.58ක් හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත රු.මිලියන8ක් ලෙස රු.මිලියන25.58ක වායුවිමෝචන අරමුදලට අදාළ නොවන පිරිවැයක් දැරීමට 2022 මාර්තු 15 දිනැති වායුවිමෝචන අරමුදල් භාරකාරමණ්ඩල රැස්වීමේදී තීරණය කර ගෙවීම් කර තිබුණි. | මෙම අරමුදල ඇති කිරීමේ මූලික අරමුණු අතර වායු තත්වය ගුණාත්මක භාවයෙන් වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම ප්‍රධාන වේ. එවැනි කටයුතු සඳහා රජයට අමතර පිරිවැයක් දැරීමට නොදී මෙම අරමුදල මගින් මුදල් ප්‍රතිපාදන වැය කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව වායු තත්වයන් පිළිබඳ නිවැරදි ප්‍රතිපත්තිමය තීන්දු තීරණවලට එළඹීම සඳහා වායුවේ ගුණාත්මකභාවය පිළිබඳ තොරතුරු අවශ්‍ය වේ. | වායුතත්ත්ව මැනීම හා වායු දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අදාළ කාර්යයන් අරමුදල විසින් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති හා මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් අතර ඇති කර ගත් ගිවිසුමකට අනුව රු.මිලියන 30.82ක වියදමින් 2013 වර්ෂයේදී අරමුදල විසින් ජංගම සංසරණ වායු තත්ත්ව අධීක්ෂණ මධ්‍යස්ථානයක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබාදී ඇති නමුත් 2016 වර්ෂයේ සිට එකී උපකරණ කට්ටලය ක්‍රියා විරහිත වීම හා අළුත්වැඩියාවට අදාළ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් අදාළ උපකරණ කට්ටලය හා එකී උපකරණ කට්ටලය ස්ථාපිත කර ඇති ලොරි රථය කිසිදු භාවිතයකින් තොරව දිරාපත්වීමට ඉඩදී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම උපකරණ කට්ටලය නීත්‍යානුකූල හිමිකම හා නඩත්තු වගකීම අරමුදල සතුව පවතින බැවින් එකී උපකරණ අලුත්වැඩියා කරන්නේ ද නැතහොත් අපහරණය කරන්නේද යන්න පිළිබඳව කාලීනව තීරණය කර අදාළ පරිදි කටයුතු කිරීමට අරමුදලේ කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම උපකරණය අලුත්වැඩියා කිරීමට සඳහා අදාල දේශිය නියෝජිතයන්ද මේ වන විට නොමැති බව අප වෙත දන්වා ඇත. ඒ අනුව අප විසින් අදාල උපකරණය භාරගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් විමසීමක් සිදු කර ඇති අතර ඔවුන් එම රථය භාරගැනීම සඳහා කැමැත්ත එලකර ඇත. | වත්කම් ආරක්ෂා කර ගැනිමට හා ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) වායු විමෝචන අරමුදලේ ගිණුම් අනුව 2022.12.31 දින දක්වා සමුච්චිත වී ඇති ලාභය රු. මිලියන 476.901 වන නමුත් එකී සමුච්චිත ලාභය ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමකින් තොරව රු. මිලියන 328.263ක් ස්ථාවර තැන්පතු වල හා රු. මිලියන 121.677 ඉතුරුම් තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | අරමුදලේ අතිරික්ත මුදල් රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව පමනක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබයි. ඒ අනුව 2022 වර්ෂයේදී රු. මිලියන 400 මුදලක් ඒකාබද්ධ අරමුදලට බැරකර ඇත. | අරමුදලේ අතිරික්ත මුදල් කාලීනව ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අරමුදල ආරම්භ කළ 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු ඉටු කිරීම වෙනුවෙන් වායු තත්ත්ව මැනීමේ උපකරණ හා දුම් පරීක්ෂණ උපකරණ වෙනත් බාහිර ආයතන වෙත ලබාදීම සඳහා රු.මිලියන 283.5ක් හා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 40ක් වැය කර ඇති නමුත් එම ආයෝජනයන් තුලින් අරමුදලේ අරමුණු ළඟා කරගෙන තිබේ ද යන්න තහවුරු කිරීම සඳහා කාර්ය සාධන වාර්තා හෝ ප්‍රගති වාර්තා කිසිවක් පවත්වාගෙන ගොස් නොතිබුණි.ඒ අනුවකාර්ය සාධන දත්ත/වාර්තා ඇසුරින් පසුගිය වසර 15 තුළ අරමුදලේ අරමුණු ඉටු කලේද යන්න සමාලොචනය කිරීමට අරමුදලේ භාරකාර මණ්ඩලය අපොහොසත්වී තිබුණි. | විගණනයෙන් පෙන්වාදී ඇති පරිදි කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු. එසේම මේ වන විටත් අරමුදලේ කාර්යයසාධනය පිලිබඳ විස්තරය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු කාර්යයසාධාන වාර්තාවට ඇතුළත් කරනු ලබයි. | කාර්ය සාධන වාර්තා හෝ ප්‍රගති වාර්තා කාලීනව සකස් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | රථවාහන ආශ්‍රිත වායු දූෂණය, ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල වාතයේ තත්ත්වය, බලශක්තිය, පරිසරය හා ආර්ථික බලපෑම් වැනි විවිධ පර්යේෂණයන් සඳහා 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය සඳහා වායු විමෝචන අරමුදල මඟින් රු.මිලියන 28.6ක වියදමක් දරා ඇති නමුත් එකී ව්‍යාපෘති මඟින් ලබාගත් අවසන් පර්යේෂණ වාර්තා ලබාගෙන කිසිදු සාධනීය ක්‍රියාමාර්ගයක් වෙනුවෙන් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් එකී වියදම් නිෂ්කාර්ය වී තිබුණි. | මේ වන විට සියලුම පර්යේෂණ වාර්තාවන් ලැබී ඇති බව දන්වා සිටින අතර පර්යේෂණ වාර්තා මඟින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා අදාළ දත්ත ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට මෙන්ම පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ ඒකකය වෙත භාරදීමට කටයුතු කර ඇති බව දන්වා සිටින අතර අපගේ වෙබ් අඩවියේ මෙන්ම පරිසර අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ එළ කිරීමට කටයුතු කර ඇත. | පර්යේෂණ වාර්තා මඟින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙලක් සකස් කල යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අරමුදල විසින් රු.මිලියන 47.247ක පිරිවැයක් දරා ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකයක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ලබාදී ඇතත් එකී ජංගම රථය වෙනත් කිසිදු ප්‍රදේශයක වායු තත්ත්ව පරීක්ෂාවකින් තොරව 2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට කොළඹ මහ නගර සභා පරිශ්‍රයේ ගාල්කර එම පරිශ්‍රයේ පමණක් වායු තත්ත්ව පරීක්ෂණ සිදුකර තිබුණි. | නාගරික ප්‍රදේශවලට ගොස් වායු තත්වය මැනීම සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම මත උපකරණ භාවිතා නොකර තැබීමෙන් එයට සිදුවිය හැකි හානිය වලක්වා ගැනීමටත්, එම උපකරණ ප්‍රයෝජනවත් ලෙස භාවිතයට ගැනීමටත්, යන හේතූන් මත කොළඹ මහ නගර සභාවේ එකගතාවය ඇතිව කොළඹ මහ නගර සභා පරිශ්‍රයේ පූර්ණ ආරක්ෂාව සහිතව ස්ථානගත කර දත්ත ලබා ගැනීම සිදු කර ඇත. | වායු තත්ත්ව පරීක්ෂණ ස්ථාන, ක්‍රමවේද, කාලය හා යොදා ගන්නා සම්පත් ඇතුලත්ව විධිමත් පරීක්ෂණ සැලසුමක් සකස් කළ යුතුය. |
| (ii) | නව දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික අනුමැතියෙන් හා අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කර ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව වායු විමෝචන අරමුදල විසින් 2017 දෙසැම්බර් 28 දින රුපියල් මිලියන 21.937ක පිරිවැයක් දරා ඩීසල් වාහන දුම් පරීක්ෂණ කට්ටල 10ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය දක්වා උක්ත දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය නීතිමය නිෂ්කාශන ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් වසර 5 කට අධික කාලයක සිට එකී උපකරණ භාවිතයකින් තොරව භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වෙමින් තිබුණි. | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථ සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හැකි වන පරිදි පරීක්ෂණ සිදු කිරීමට අවසර ලබා දෙන ලද අතර ඒ පිළිබඳ මේ වන විට සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල දැනුවත් කර ඇති බවද දන්වන අතර ඉතා ඉක්මනින් එම කටයුතු ආරම්භ වීමට නියමිත බව දන්වමි. | මූලික අනුමැතීන් හා අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් මෙවැනි ආයෝජනයන් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | වායු විමෝචන භාරකාර අරමුදල රු.මිලියන 82.75ක වියදමක් දරා සංසරණ වායු තත්ත්ව මැනීමේ ඒකක දෙකක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත හා රු.මිලියන 47.24ක පිරිවැය සහිත ජංගම සංසරණ වායු තත්ත්ව මැනීමේ උපකරණය ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ලබාදී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාළ උපකරණ මඟින් ලබාගන්නා මිනුම් දත්ත අරමුදල වෙත ලබාදිය යුතු නමුත් උක්ත වායු තත්ත්ව මැනීමේ උපකරණය මඟින් ලබාගන්නා මිනුම් දත්ත භාවිතයෙන් සිදු කළ යුතු කාර්යයක් සම්බන්ධයෙන් පූර්ව නිශ්චිත වැඩපිළිවෙළක් නොමැති වීම හා ඒකී මිනුම් දත්ත භාවිතා කර කිසිදු ප්‍රයෝජනවත් කාර්යයක් සිදු නොකිරීම හේතුවෙන් රු.මිලියන 130කට අධික රජයේ මුදල් ආයෝජනය හා උපකරණ මඟින් ලබාගෙන ඇති මිනුම් දත්ත නිෂ්කාර්යය වී තිබුණි. | මෙම උපකරණ මිලදී ගැනීමේ ප්‍රධාන අරමුණ වන්නේ වායු තත්ව කළමනාකරණ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම හා එවා මහජනතාවට ප්‍රදර්ශනය කිරීමත්ය, මෙම දත්ත පරිසර අමාත්‍යාංශයේ වායු තත්ත්ව කළමනාකරණ කේන්ද්‍රය මඟින් වායු තත්ත්ව කළමනාකරණය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති, තීරණ හා ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහාත් යොදා ගැනීමට යොමු කර ඇති බව දන්වමි. | වායු තත්ත්ව මැනීමේ උපකරණය මඟින් ලබාගන්නා මිනුම් දත්ත භාවිතයෙන් සිදු කළ යුතු කාර්යයක් සම්බන්ධයෙන් නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. |